ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

---

# විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ නව නිර්දේශයට අන්තර්ග්‍රහණය කළ සිසුන් සඳහා උපාධි III පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කිරීම

**විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ පැරණි නිර්දේශය යටතේ (2009 හෝ ඊට පෙර) ලියාපදිංචි වී සිට නව නිර්දේශය වෙත අන්තර්ග්‍රහණය වූ සිසුන් සඳහා පමණක් මෙම නිවේදනය අදාළ වේ.**

පැරණි නිර්දේශයේ සිට නව නිර්දේශයට අන්තර්ග්‍රහණය කළ සිසුන්ට අදාළ උපාධි III පරීක්ෂණයට අදාළ ප්‍රතිඵල පහත **Link 2 - Part III (Absorbed Students)** මගින් බාගත කළ හැකිවේ.

- එහිදී ලැබෙන ප්‍රතිඵල ලේඛනයේ පළමුව දැක්වෙන්නේ සිසුන් විසින් විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි **පැරණි නිර්දේශය යටතේ උපයා ගත් ලකුණු නව නිර්දේශයේ උපාධි III කොටසෙහි ඊට අදාළ විෂය ඒකකයන්ට ඇතුලත් කර, නව නිර්දේශයේ ශ්‍රේණි ලකුණු පටිපාටියට පරිවර්තනය කර නිකුත් කරන ප්‍රතිඵලය** වේ.

- ප්‍රතිඵල ලේඛනයේ දෙවනුව දැක්වෙන්නේ නව නිර්දේශය යටතේ 2022 ජනවාරි මස පැවැති උපාධි III පුනර් පරීක්ෂණයේ ඔබ පෙනී සිටි විෂයන්ට අදාළ ප්‍රතිඵලයයි.

## උපාධි III කොටසට අදාළ සමස්ථ ප්‍රතිඵලය (Overall Results)

**උපාධි III කොටසට අදාළ සමස්ථ ප්‍රතිඵලය (Overall Results) ගණනය කර ඇත්තේ පරිවර්තනය කළ ප්‍රතිඵල හා 2022 ජනවාරි පැවති උපාධි III පුනර් පරීක්ෂණයේ ප්‍රතිඵල එක්ව ගෙන, විෂයන් 06 සඳහා ඒ එක් එක් විෂයට ලබා ඇති වැඩිම ශ්‍රේණිය සැලකිල්ලට ගෙන වන අතර 2022 ජනවාරි මස පැවැති උපාධි III පුනර් පරීක්ෂණයට පෙනී නොසිටි සිසුන්ගේ සමස්ථ ප්‍රතිඵලය පරිවර්තනය කළ ප්‍රතිඵලය (Converted Results) මත පමණක් පදනම් ව ගණනය කර ඇත.**

- **මෙම කරුණ පැහැදිලි කර ගැනීමට පහත උදාහරණය සලකන්න.**

(1) Converted Results From Old Syllabus to New Syllabus

| Subject | Grade |
|---|---|
| BME 3501 | D+ |
| BME 3502 | C+ |
| BME 3503 | AB |
| BME 3504 | AB |
| BME 3505 | C+ |
| BME 3508 | C+ |

(2) Part III Repeat Examination - Conducted on January 2022

| Subject | Grade |
|---|---|
| BME 3501 | E |
| BME 3503 | C |
| BME 3504 | C |

Considering (1) & (2) Overall Results : Pass

**ඉහත උදාහරණයේ දැක්වෙන ශිෂ්‍යයා පරිවර්තනය කළ ප්‍රතිඵල අනුව BME 3501, BME 3502, BME 3505, BME 3508 විෂයන් සමත්ව ඇති අතර ඉන්පසුව 2022 ජනවාරි නව නිර්දේශය යටතේ පැවැත්වූ උපාධි III පුනර් පරීක්ෂණයට පෙනී සිට BME 3503 හා BME 3504 යන විෂයන් සමත්ව ඇත.**

**ඉහත උදාහරණයේ වර්ණ ගන්වා ඇත්තේ මෙම ශිෂ්‍යයාගේ GPA අගය ගණනයට යොදාගත් වැඩිම ශ්‍රේණි වේ.**

**මෙහිදී BME 3501 විෂයට පැරණි නිර්දේශය යටතේ දුර්වල සාමාර්ථයක් (D+) ලබා ඇති නිසා නැවත පෙනී සිටීමට ශිෂ්‍යයාට දන්වා ඇත. නමුත් 2022 ජනවාරි පරීක්ෂණයේදී BME 3501 විෂයට E සාමාර්ථයක් ලැබුවද BME 3503 හා BME 3504 යන විෂයන්හි ප්‍රතිඵල අනුව උපාධි III කොටස සමත්වීමට අවශ්‍ය GPA අගය හා අනෙකුත් නිර්ණායක සම්පූර්ණ වන නිසා මෙම ශිෂ්‍යයා BME 3501 විෂයට ලබාගෙන ඇති D+ සාමාර්ථය සමග උපාධි III කොටස සමත් ව ඇත.**

## <u>සැලකිය යුතුයි</u>

1. නව නිර්දේශයේ විභාග සමත්වීමේ නිර්ණායක පිළිබඳ දැනුවත් වීමට www.external.sjp.ac.lk වෙබ් අඩවියේ මුල් පිටුවේ (Home Page) ඇති Quick Links යටතේ පල කර තිබෙන Faculty of Management Studies and Commerce Prospectus පරිශීලනය කරන්න.

2. මෙම ප්‍රතිඵල ලේඛන සිසුන්ගේ දැන ගැනීම සඳහා පමණක් වන අතර අන්තර්ග්‍රහණය සඳහා වන විශ්වවිද්‍යාලයේ සනාතන සභා තීරණය අනුව අවසාන ප්‍රතිඵල ලේඛනය උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසුව නිකුත් කරනු ලැබේ.

3. මීට ඉහතදී දැනුම් දුන් පරිදි අන්තර්ග්‍රහණය කළ සිසුන් සඳහා ''**විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය**'' සම්පූර්ණ කිරීමට ලබාදී ඇති කාලය 2023-12-31 න් අවසන්වේ.

**සහකාර ලේඛකාධිකාරී**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
2022-08-08

**විමසීම්: 011 5929 791**
**(රජය විසින් නියම කල රාජකාරී දිනයන්හි පෙ.ව. 8.30 - ප.ව. 4.00 අතර)**